සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2011

# පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2011 අගෝස්තු

## I පත්‍රය

මිනිත්තු 45 යි.

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **තුන** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |

| | අවසාන ලකුණ |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කේත අත්සන | සංකේත අංකය |
|---|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | | |
| ලකුණු පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| අධීක්ෂක | | |

[2 වැනි පිටුව බලන්න


**දී ඇති උපදෙස් අනුව රූප පෙළින් ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- වචන යුගලයට වඩාත් ම ගැළපෙන රූපය තෝරන්න.


1. **ඇසුම - විනෝදය**


(1)



(2)


(3)

2. **ආලෝකය - උණුසුම**



(1)



(2)



(3)

- **සම්බන්ධතාව අඩුවෙන් ම පෙන්වන රූප යුගලය ඇති කොටුව තෝරන්න.**


3.



(1)



(2)


(3)

4.


(1)


(2)


(3)

- **දී ඇති කවිය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

කුරුලු ගීත නද පැතිරෙන
ගත සනසන මද නල එන
සුවඳ හමන මල් සුපිපෙන
අලුයම අසිරිය බල මැන

5. කවියෙහි දැක්වෙන්නේ, උදයේ හමන සුළඟ,
   (1) කුරුලු ගී නද පතුරවන බවයි.
   (2) ශරීරය සනහාලන බවයි.
   (3) මල් සුවඳ දසත පතුරවන බවයි.

6. අලුයම සිදුවන නමුත් කවියෙහි සඳහන්ව **නැති** දෙයකි,
   (1) සිසිල් මද සුළං හැමීම
   (2) සුවඳවත් මල් පිපීම
   (3) ආලෝකය සෙමෙන් පැතිරීම

[3 වැනි පිටුව බලන්න

විභාග අංකය ..............................

- හිස්තැන්වලට ගැළපෙන වචන අයත් පිළිතුර තෝරන්න.

7. ජයග්‍රහණයෙන් .............. පත් තරඟකරුවෝ .............. වූහ.

(1) සතුටට - අත්පුඩි ගසන්නට
(2) වෙහෙසට - සුභ පතන්නට
(3) ප්‍රීතියට - කඳුළු සලන්නට

- උපමාවට ගැළපෙන අවස්ථාව දැක්වෙන පිළිතුර තෝරන්න.

8. **'ඇවිළෙන ගින්නට පිදුරු දමන්නාක් මෙන්'**


(1) කරදර අවසන් කිරීමට උදව් කිරීම
(2) තිබෙන කරදර වැඩි කිරීමට ක්‍රියා කිරීම
(3) දුප්පත් අයට මිල මුදලින් ආධාර කිරීම


9. **'අහසට ඉනිමං බඳින්නාක් මෙන්'**

(1) කළ නොහැකි දෙයක් කිරීමට උත්සාහ කිරීම
(2) ඉතා උනන්දුවෙන් හා ධෛර්යයෙන් යුතුව ක්‍රියා කිරීම
(3) ලොකු වැඩක් කිරීමට පටන් ගැනීම


- මුලින් දී ඇති රූප සම්බන්ධ කළ විට ලැබෙන රූපය තෝරන්න.

**10.**






(1)




(2)




(3)

**11.**





(1)



(2)



(3)

[4 වැනි පිටුව බලන්න

- රූපය සම්පූර්ණවීමට අවශ්‍ය කොටස තෝරන්න.

**12.**





(1)



(2)



(3)

**13.**





(1)


(2)



(3)

- හිස් කොටුවට ගැළපෙන රූපය තෝරන්න.

**14.**






(1)



(2)



(3)

**15.**





(1)


(2)


(3)

- දී ඇති උපදෙස් අනුව නිවැරදි පිළිතුර තෝරන්න.

**16.** පුරසඳ පායා තිබූ දිනයකට පසුව එන සති දෙකක් තුළ, දින 4 ක දී රාත්‍රී අහසෙහි සඳ දිස් වූ අයුරු පහත රූපවල දක්වේ.


*A*


*B*


*C*



*D*


එම දින හතර පිහිටන අනුපිළිවෙළ වන්නේ,

(1) $D \rightarrow A \rightarrow B \rightarrow C$ (2) $C \rightarrow B \rightarrow D \rightarrow A$ (3) $D \rightarrow B \rightarrow C \rightarrow A$

[5 වැනි පිටුව බලන්න


17. රූප රටාවේ හිස් කොටුවට ගැළපෙන රූපය තෝරන්න.






(1) (2) (3)


18. රූපයේ පෙන්වන පරිදි, දෙකෙළවර නැවත එකතුවන සේ කම්බියක් නැවීමෙන් ලබාගත හැකි හැඩය කුමක් ද?




(1) (2) (3)

19. කඩ ඉරි මගින් දක්වා ඇති මාර්ග තුන අතුරෙන් දිගින් අඩු ම මාර්ගය කුමක් ද?




(1) (2) (3)

20. ඝනකයක් නිර්මාණය කිරීමට හැකි රූපය තෝරන්න.



(1) (2) (3)

21. මෙම රූපයේ ඇති ත්‍රිකෝණ ගණන කීය ද?



(1) 8 කි. (2) 10 කි. (3) 12 කි.

[6 වැනි පිටුව බලන්න

22. වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) $6 \times 6 - 6 = 30$ (2) $5 \times 5 + 5 = 30$ (3) $33 - 33 - 3 = 30$

23. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) $888 + 88 + 88 + 8 + 8 = 1000$

(2) $888 + 88 + 8 + 8 + 8 = 1000$

(3) $888 + 88 + 88 + 8 + 8 + 8 = 1000$

24. සමචතුරස්‍ර එළවලු කොටුවක, පැත්තක දිග මීටර 12 කි. එහි මායිම දිගේ මීටර 3 න් 3 ට කම්බි කණු සිටුවා ඇත. එසේ සිටුවා ඇති කම්බි කණු ගණන කීය ද?


(1) 20 (2) 16 (3) 12

25. A ගේ පියා, B ගේ පුතා නම් A තමැත්තා B ගේ කවුරුන් ද?

(1) මුනුබුරා (2) පියා (3) පුතා


- සංඛ්‍යා සැකසුම බලා නිවැරදි පිළිතුර තෝරන්න.

26. මෙම රටාවේ C සහ D සඳහා ගැළපෙන සංඛ්‍යා පිළිවෙළින් මොනවා ද?




(1) 30 සහ 35 (2) 40 සහ 45 (3) 33 සහ 38

27. මෙම රටාවේ *A* සහ *B* සඳහා ගැළපෙන සංඛ්‍යා පිළිවෙළින් මොනවා ද?




(1) 4 සහ 6 (2) 6 සහ 4 (3) 8 සහ 4

- පෝලිමක විමල් සිටින්නේ ඉදිරි කෙළවරේ සිට 12 වෙනියාට ය. පසුපස කෙළවරේ සිට 8 වෙනියාට ය. ඒ අනුව,

28. පෝලිමේ කී දෙනෙක් සිටිත් ද?

(1) 19 (2) 20 (3) 21

29. එම පෝලිමේ අනිල් සිටින්නේ ඉදිරිපස සිට 5 වෙනියාට නම් ඔහුට පසුපසින් කී දෙනෙක් සිටිත් ද?

(1) 16 (2) 15 (3) 14

- වගුවේ තොරතුරු අනුව පිළිතුරු සපයන්න.

| දිනය | ජනවාරි 31 | පෙබරවාරි 28 | මාර්තු 31 | අප්‍රියෙල් 30 | මැයි 31 |
|---|---|---|---|---|---|
| සංඛ්‍යාව | 31 | 59 | ... | 120 | 151 |

30. මාර්තු 31 දිනයට ගැළපෙන සංඛ්‍යාව කුමක් ද?
(1) 89 (2) 87 (3) 90

31. 100 සංඛ්‍යාව ගැළපෙන්නේ කුමන දිනයට ද?
(1) අප්‍රියෙල් 01 (2) අප්‍රියෙල් 10 (3) අප්‍රියෙල් 20

- කවියක පද හතර මාරුකර ලියා ඇති අයුරු පහත දැක්වේ. ඒවායේ නිවැරදි අනුපිළිවෙළ කුමක් ද?

32. (A) ඵලයක් නෙළුවා
(B) මිලකර විකුණා
(C) පැලයක් සිටුවා
(D) සතුටක් ලැබුවා
(1) A, C, B, D (2) C, A, B, D (3) D, C, A, B

- තරග වට තුනකදී ක්‍රීඩකයින් පස්දෙනකු ක්‍රීඩා කළ අයුරු පහත දැක්වේ.

| | සමන් | කමල් | ගනේෂ් | හසන් | සුදත් |
|---|---|---|---|---|---|
| පළමුවන වටය | − | + | + | 0 | + |
| දෙවන වටය | 0 | 0 | 0 | − | + |
| තුන්වන වටය | + | − | + | 0 | − |

හොඳයි = +
සාමාන්‍යයි = 0
දුර්වලයි = −

33. මුළු තරගයේදී හොඳින් ම ක්‍රීඩා කර ඇත්තේ,
(1) ගනේෂ් ය. (2) සුදත් ය. (3) සමන් ය.

34. තරගයේදී කමල්ට වඩා හොඳින් ක්‍රීඩා කර ඇති ක්‍රීඩකයකු වන්නේ,
(1) සමන් ය. (2) සුදත් ය. (3) හසන් ය.

- නිවැරදි පිළිතුර තෝරන්න.

35. උත්සවයකට පළාත් කිහිපයකින් පැමිණි ළමයින් සඳහා හැඩයෙන් සහ පාටින් වෙනස් වූ ලාංඡන ලබා දී තිබුණි.

මධ්‍යම පළාත - නිල්පාට
උතුරු පළාත - කහපාට
දකුණු පළාත - රතුපාට

පිරිමි ළමයි - වෘත්තය
ගැහැනු ළමයි - චතුරස්‍රය

ඒ අනුව නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) උතුරු පළාතේ ගැහැනු ළමයි නිල්පාට චතුරස්‍ර පැලඳ සිටියහ.
(2) මධ්‍යම පළාතේ පිරිමි ළමයි නිල්පාට වෘත්ත පැලඳ සිටියහ.
(3) දකුණු පළාතේ ගැහැනු ළමයි කහපාට චතුරස්‍ර පැලඳ සිටියහ.

[8 වැනි පිටුව බලන්න

36. අද ඉරිදාවකි. පෙරේදාත් පසුගිය සඳුදාත් අතර තවත් දින කීයක් තිබුණි ද?

(1) 1 (2) 2 (3) 3

37. ඇතුළත නොපෙනෙන පෙට්ටියක තිල්පාට පෑන් තුනකුත් කළු පාට පෑන් තුනකුත් ඇත. පෑන් දෙස නොබලා, **එක ම පාට පෑන් දෙකක් නොවැරදී ම** ලැබීමට, පෙට්ටියෙන් ඉවතට ගත යුතු **අඩු ම** පෑන් ගණන කීය ද?

(1) 2 (2) 3 (3) 4

38. වැංකියක ධාරිතාව ලීටර 10 කි. සුනිල් වරකට ලීටර හතරක් බැගින් දමමින් එම වැංකියට ජලය පුරවයි. ඒ සෑම වාරයකට ම පසු ඔහුගේ මල්ලී ලීටර දෙක බැගින් ජලය ඉවතට ගනියි. මුලින් ම වැංකිය ජලයෙන් පිරෙන්නේ සුනිල් කී වරක් ජලය දැමූ පසු ද?

(1) 4 (2) 5 (3) 6

39. සරත් ළඟ රුපියල් දෙකේ කාසි සහ රුපියල් පහේ කාසිවලින් රුපියල් 23 ක් ඇත. එහි තිබිය හැකි රුපියල් දෙකේ කාසි ගණන කීය ද?

(1) 3 (2) 4 (3) 6

40. බස්රියක්, ලොරියක් සහ මෝටර් රථයක්, කිලෝමීටර 150 ක් දුර ගමනක් යාම සඳහා එකම ස්ථානයකින් පිටත්විය. ඒවා පිටත් වූ වේලාවත් ගමන් කළ වේගයත් පහත දක්වේ.

| වාහනය | පිටත් වූ වේලාව | වේගය (පැයට කිලෝමීටර) |
|---|---|---|
| බස්රිය | පෙ.ව 6.00 | 50 |
| ලොරිය | පෙ.ව 7.00 | 30 |
| මෝටර් රථය | පෙ.ව 8.00 | 75 |

ඒවා ගමනාන්තයට ළඟා වූ අනුපිළිවෙළ කුමක් ද?

(1) මෝටර් රථය, බස්රිය, ලොරිය
(2) බස්රිය, ලොරිය, මෝටර් රථය
(3) බස්රිය, මෝටර් රථය, ලොරිය

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2011

**පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2011 අගෝස්තු**

# II පත්‍රය

**පැය 1 මිනිත්තු 15 යි.**

විභාග අංකය : ..................................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** නියමිත ස්ථානයේ ද ඔබගේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.)
* පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
* පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු **තිත් ඉර මත** ලියන්න.
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |

| | අවසාන ලකුණ |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන | සංකේත අංකය |
|---|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | | |
| ලකුණු පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| අධීක්ෂක | | |

[2 වැනි පිටුව බලන්න.

**1. පහත දැක්වෙන ඡේදය කියවන්න.**

අයුක්තිය, අසාධාරණය, නොඉවසූ උන්වහන්සේ කිසෙත සුළු තැනැත්තකු වුව ද අනුන්ගේ දුකෙහි දී වෙඬරු පිඩක් මෙන් උණු වන හදවතක් ඇති අයකු බව උන්වහන්සේ ළඟින් ඇසුරු කළ අය දැන සිටියෝ ය. සිංහල, පාලි, සංස්කෘත ආදී භාෂා ද බුද්ධ ධර්මය ද මැනවින් හදාරා සිටි මහින්ද හිමියන්ට 1934 දී කොළඹ ආනන්ද විද්‍යාලයේ ආචාර්ය තනතුරක් ලැබීම උන්වහන්සේගේ ජීවිතයේ වැදගත් සිදුවීමක් විය.

**ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරා ගෙන, තිත් ඉරි මත ලියන්න.**

(i) මෙම ඡේදයේ සඳහන් වන්නේ කවුරුන් පිළිබඳ ව ද? :..............................................

(ii) **'ඉතා හොඳින්'** යන්නෙහි **අදහස දෙන** පදය තෝරා ලියන්න. :..............................................

(iii) **'ඉගෙන'** යන පදයට **අර්ථයෙන් සමාන** පදය තෝරා ලියන්න. :..............................................

(iv) **'දුරින්'** යන්නට අර්ථයෙන් **විරුද්ධ** පදය තෝරා ලියන්න. :..............................................

(v) ඡේදයේ සඳහන් **උපමාව** තෝරා ලියන්න. :..............................................

(vi) ඡේදයේ සඳහන් **අතීත කාල බහු වචන ක්‍රියා පදය** තෝරා ලියන්න.:..............................................

2. (අ) පහත දී ඇති එක් එක් වගන්තිය සඳහා ගැළපෙන වචනය, වරහන් තුළින් තෝරා **තිත් ඉර මත** ලියන්න.

**(මව, ලියයි, යමු, මේසය, යමි, ශිෂ්‍යයෝ, පොත්)**

(i) ප්‍රාණවාචී බහු වචන නාම පදයකි, :..............................................

(ii) අප්‍රාණවාචී ඒක වචන නාම පදයකි, :..............................................

(iii) උත්තම පුරුෂ බහු වචන ක්‍රියා පදයකි, :..............................................

(ආ) පහත දී ඇති එක් එක් වාක්‍ය ඛණ්ඩයට අර්ථයෙන් සමාන තනි වචනය, ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

(i) රටින් රට සැරිසරන්නා :..............................................

(ii) පොත් පත් කියවන්නා :..............................................

(iii) රඟපාන තැනැත්තිය :..............................................

3. පහත සඳහන් **ඉංග්‍රීසි වාක්‍යවල අර්ථ සිංහලෙන්** ලියන්න.

(i) Shall we pluck flowers? :..............................................

(ii) May I come in? :..............................................

(iii) I will come tomorrow. :..............................................

4. පහත සඳහන් වාක්‍යයෙහි **අර්ථය ඉංග්‍රීසියට හරවා ඉංග්‍රීසි අකුරෙන් ම** ලියන්න.

**කරුණාකර පංතිකාමරය පිරිසිදු කරන්න.** :..............................................

[3 වැනි පිටුව බලන්න.

විභාග අංකය ..............................

5. එක් එක් පින්තූරයට ගැළපෙන **ඉංග්‍රීසි නම ඉංග්‍රීසි අකුරෙන් ම** ලියන්න.

(i)  ..............................

(ii)  ..............................

6. (i) පහත සඳහන් වගන්තිය දෙමළෙන් කියන ආකාරය සිංහල අකුරෙන් ලියන්න.
**එන්න වාඩිවෙන්න**

..............................

(ii) පහත සඳහන් වාක්‍යයේ අර්ථය සිංහලෙන් ලියන්න.
**කුලගම් එත්තගෙන මණික්කු තිරස්කරප්පඩුම්**

..............................

7. පහත සඳහන් යෙදුම්වල හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) කොහොඹ ගහට ................ වැල ගියා වගෙයි.

(ii) ................ නැති වළට කාහයා පණ්ඩිතයා ය.

8. සුදුසු විරාම ලකුණු යොදන්න.

(i) නරිහාමි කලබලයෙන්වත් ද

(ii) මෙසේ ගෙනෙන පස් ගල් කඳු දෙක අතරේ දමමින් වැව් කන්ද ගොඩනැගුවේ ය

9. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය **යටින් ඉරක් අඳින්න.**

(i) (1) ආරාදනා (2) ආරාදණා (3) ආරාධනා (4) ආරාධණා

(ii) (1) පැනිමුළ (2) පැනිමුල (3) පැණිමුළ (4) පැණිමුල

- අංක **10** සිට **39** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා, **යටින් ඉරක් අඳින්න.**

10. ශ්‍රී ලංකාවේ ඒකදේශික ශාකයක් වන්නේ,
(1) පොල් ය. (2) අඹ ය. (3) දෙළුම් ය. (4) හොර ය.

11. ශාකයකට මල්වලින් ඇති ප්‍රයෝජනය වන්නේ,
(1) අලංකාරය ලබා දීම ය. (2) තම වර්ගයා බෝ කිරීමට උපකාර කිරීම ය.
(3) සුවඳ පැතිරවීම ය. (4) ශාකයේ ආයු කාලය වැඩි කිරීම ය.

12. සුළඟින් ව්‍යාප්ත වන බීජ සමූහයක් අඩංගු පිළිතුර වන්නේ,
(1) නාගදරණ, වරා, මොනරකුඩුම්බිය ය. (2) කොටිල, වරා, මොනරකුඩුම්බිය ය.
(3) කොටිල, කජු, හොර ය. (4) නාගදරණ, කජු, හොර ය.

[4 වැනි පිටුව බලන්න.

13. ශාකභෝජී සතකු වන්නේ,
(1) නයා ය. (2) කටුස්සා ය. (3) කබරගොයා ය. (4) මුගටියා ය.

14. පස සාරවත් කිරීමට උදව් කරන සතකු වන්නේ,
(1) පත්තෑයා ය. (2) ගැඩවිලා ය. (3) හැකරැල්ලා ය. (4) කුඩැල්ලා ය.

15. බෝග වගාවේ දී ගොවියාට උපකාරවත් වන සතකු වන්නේ,
(1) ශ්‍රී මැස්සා ය (2) කුඩිත්තා ය. (3) ගොයම් මැස්සා ය. (4) බත් කූරා ය.

16. රෝපණය කිරීමට සුදුසු බීජයක ලක්ෂණයක් වන්නේ,
(1) නොමේරූ බීජයක් වීම ය.
(2) පිටපොත්ත පැල්ලම් රහිත ව දීප්තිමත් වීම ය.
(3) තුවාල සහිත වීම ය.
(4) බීජය අව පැහැවීම ය.

17. විටමින් බහුල ආහාරයක් වන්නේ,
(1) කඩල ය. (2) බතල ය. (3) සෝයා ය. (4) තක්කාලි ය.

18. දියවැඩියා රෝගය පාලනය කිරීම සඳහා වඩාත් සුදුසු ආහාරය වන්නේ,
(1) පාන් ය. (2) නූඩ්ල්ස් ය. (3) කව්පි ය. (4) මඤ්ඤොක්කා ය.

19. මදුරුවන් මර්දනය කිරීම සඳහා පහසු මෙන් ම වඩාත් සුදුසු ක්‍රමය වන්නේ,
(1) නිවසේ සිටින මදුරුවන් විනාශ කිරීම ය.
(2) මදුරු බිත්තර විනාශ කිරීම ය.
(3) මදුරු කීටයන් විනාශ කිරීම ය.
(4) අවට පරිසරයේ ජලය එක්රැස් වීමට ඉඩ නොතැබීම ය.

20. බෝවන රෝගයක් (ප්‍රදේශය පුරා) පැතිර යන අවස්ථාවක දී වහා ම දැනුම් දිය යුත්තේ කාට ද?
(1) පොලිස් ස්ථානාධිපතිවරයාට (2) රෝහලේ වෛද්‍ය නිලධාරිවරයාට
(3) විදුහල්පතිවරයාට (4) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට

21. භූමිකම්පාවක දී තම ආරක්ෂාව සඳහා වහා ම කළ යුතු වන්නේ,
(1) තමා සිටින ස්ථානයේ ම සිටීම ය. (2) ගසක් යටට යාම ය.
(3) උස් ගොඩනැගිල්ලකට යාම ය. (4) විවෘත ස්ථානයකට යාම ය.

22. 
මෙම රූපයේ දක්වෙන උපකරණය භාවිත කිරීමෙන්
(1) සුළං හමන දිශාව දැනගත හැකි ය.
(2) සුළගේ වේගය මැනගත හැකි ය.
(3) සුළි සුළං පිළිබඳ ව අනාවැකි පළ කළ හැකි ය.
(4) කාලගුණය පිළිබඳ ව අනාවැකි පළ කළ හැකි ය.

23. ශ්‍රී ලංකාවේ උස ම දිය ඇල්ල වන්නේ,
(1) බඹරකන්ද ය. (2) දියලුම ය.
(3) ලක්ෂපාන ය. (4) දුන්හිඳ ය.

[5 වැනි පිටුව බලන්න.

24. 

රූපයේ දැක්වෙන තරු රටාව හඳුන්වනු ලබන්නේ,
(1) මහවලසා ලෙස ය.
(2) හැඳිත්තත් තරු ලෙස ය.
(3) ගෝනුස්සා ලෙස ය.
(4) දඩයක්කාරයා ලෙස ය.

25. කොළඹ, මෝදර ප්‍රදේශයෙන් මුහුදට වැටෙන්නේ,
(1) මහවැලි ගඟ ය. (2) කැලණි ගඟ ය. (3) කළු ගඟ ය. (4) වලවේ ගඟ ය.

26. අභය (බසවක්කුලම) වැව කරවන ලද්දේ,
(1) පණ්ඩුකාභය රජතුමා විසිනි. (2) දේවානම්පියතිස්ස රජතුමා විසිනි.
(3) ධාතුසේන රජතුමා විසිනි. (4) මහසෙන් රජතුමා විසිනි.

27. 

කහපාට පසුබිමෙහි කළුපාටින් ඇති මෙම මාර්ග සංඥාවෙන් නියැවෙන්නේ,
(1) පදිකයන් මාරුවන ස්ථානය ඉදිරියෙහි යන්නයි.
(2) අනතුරු සහිත වංගුව ඉදිරියෙහි යන්නයි.
(3) වැඩ කරන මිනිසුන් ඉදිරියෙහි යන්නයි.
(4) ළමයින් මාරුවන ස්ථානය ඉදිරියෙහි යන්නයි.

28. රතු සහ කහ වර්ණ මිශ්‍ර කිරීමෙන් සැදෙන වර්ණය කුමක් ද?
(1) දුඹුරු (2) රෝස (3) දම් (4) තැඹිලි

29. සකපෝරුව යොදා ගනු ලබන්නේ,
(1) වළං කර්මාන්තය සඳහා ය. (2) කුඹුරු වැඩ සඳහා ය.
(3) පතල් කර්මාන්තය සඳහා ය. (4) මැණික් ඔපමට්ටම් කිරීම සඳහා ය.

30. ලියන කැටයමක් කපා ගැනීමට භාවිත කළ හැකි සුදුසු ම උපකරණය වන්නේ,
(1) බුරුමය ය. (2) කතුර ය. (3) නියන ය. (4) පෑකැටිය ය.

31. 

රූපයෙන් දැක්වෙන්නේ,
(1) මහාචාර්ය ආනන්ද කුමාරස්වාමි මහත්මා ය.
(2) ශ්‍රීමත් ඩී.බී. ජයතිලක මහත්මා ය.
(3) ආචාර්ය ටී.බී. ජයා මහත්මා ය.
(4) අනගාරික ධර්මපාලතුමා ය.

32. ඇඳුමක ගැටුණු තාර පැල්ලමක් ඉවත් කිරීමට සුදුසු ම ද්‍රව්‍යය වන්නේ,
(1) පොල්තෙල් ය. (2) භූමිතෙල් ය. (3) දෙහිලුණු ය. (4) සබන් ය.

33. දිනපතා පුවත්පත්වල අවසන් පිටුවෙහි බොහෝවිට ඇතුළත් වන්නේ,
(1) හදිසි අනතුරු පිළිබඳ ව ය.
(2) ක්‍රීඩා තොරතුරු ය.
(3) විදෙස් පුවත් ය.
(4) රූපවාහිනී වැඩසටහන් විස්තර ය.


34. 

රූපයෙහි දැක්වෙන පාදය අයත් වන්නේ,
(1) කුකුළාට ය.
(2) තාරාවාට ය.
(3) ගිරවාට ය.
(4) උකුස්සාට ය.


(6 වැනි පිටුව බලන්න.

35. චන්ද්‍රයා වඩාත් ම විශාල ව අහසේ දැකිය හැකි වන්නේ,
(1) පසළොස්වක දිනට පෙර දින ය.
(2) පසළොස්වක දින ය.
(3) පසළොස්වක දිනට පසු දින ය.
(4) අටවක දින ය.


36. විදුලි පන්දමක් වඩාත් දීප්තිමත් ව දැල්වීම සඳහා වියළි කෝෂ නිවැරදි ව සම්බන්ධ කළ යුතු ආකාරය දැක්වෙන්නේ කුමන රූපයේ ද?



(1) (2) (3) (4)


37. 

රූපයෙන් දැක්වෙන මැහුම් ක්‍රමය වඩාත් සුදුසු වන්නේ,
(1) ඉරුණු ඇඳුමක් මැසීමට ය.
(2) බොත්තම් කාසයක් මැසීමට ය.
(3) ඇඳුමක වාට්ටියක් මැසීමට ය.
(4) කමිසයක කොළරය මැසීමට ය.

38. 

මෙම රූපික ප්‍රකාශනයෙන් අදහස් වන්නේ කුමක් ද?
(1) බිඳෙන සුළුයි.
(2) පරෙස්සමෙන් අල්ලන්න.
(3) මේ පැත්ත උඩට.
(4) එක මත එක ගබඩා නොකළ යුතු ය.

39. තරඟ දිවීමක ආරම්භක ඉරියව්ව දැක්වෙන රූපය කුමක් ද?





● දී ඇති හිස්තැන් මත පිළිතුරු සපයන්න.

40. රටාවේ ඊළඟ සංඛ්‍යා දෙක, පිළිවෙළින් ලියන්න.
4040, 4030, 4020, 4010, ............, ............

41. පහත දී ඇති භාග අතුරෙන්, $\frac{1}{3}$ ට තුල්‍ය භාගය තෝරා ලියන්න.
$\frac{1}{6}, \frac{2}{6}, \frac{3}{6}, \frac{4}{6}$ ............

42. රූපයෙහි $\frac{1}{8}$ ක් අඳුරු කර ඇත.



(i) එහි තවත් $\frac{1}{4}$ ක් අඳුරු කර දක්වන්න.
(ii) එවිට අඳුරු කර **නොමැති ව** ඉතිරි වන කොටස භාගයක් ලෙස ලියන්න. ............

43. 3, 5, 7, 9 යන සංඛ්‍යා නිවැරදි ව යොදාගනිමින්, හිස්තැන් පුරවන්න. (එක් සංඛ්‍යාවක් කිහිපවරක් වුව ද යොදාගත හැකි ය.)
(i) 5 + ... + ... = 21
(ii) ... + ... + ... = 19
(iii) ... + ... − 3 = 13

[7 වැනි පිටුව බලන්න.

**44.** පිතුරත් තිදෙනෙක්, එක් අයකුගෙන් රු. 200 බැගින් එකතු කළ මුදලින් රු. 285 කට පලතුරු මිලට ගෙන, ඉතිරි මුදල තිදෙනා අතර සමසේ බෙදා ගත්හ.

(i) පලතුරු මිල දී ගත් පසු ඉතිරි වූ මුදල කීය ද? රු. ..................



(ii) ඉතිරි මුදලෙන් එක් අයකුට කොපමණ ලැබුණේ ද? රු. ..................

**45.** උදෑසන 6.50 ට පාසලට පැමිණි සුනිල්, පස්වරු 2.15 තෙක් පාසලේ රැඳී සිට, නිවෙසට යාමට පිටත්විය.

(i) සුනිල් පාසලෙන් පිටත් වූ වේලාව, පැය 24 ඔරලෝසුව අනුව ලියන්න. පැය ......... : .........


(ii) සුනිල් පාසලේ රැඳී සිටි කාලය කොපමණ ද? පැය ........... මිනිත්තු ...........

**46.** වගුවෙහි හිස්තැන් පුරවන්න.

| ඝන වස්තුව | මුහුණත් ගණන | ශීර්ෂ ගණන | දාර ගණන |
|---|---|---|---|
| (i) ඝනකාභය  | 6 | ......... | ......... |
| (ii) චතුස්තලය  | 4 | ......... | ......... |

**47.** (i) ප්‍රස්තාරය අනුව වගුවේ හිස්තැන පුරවන්න.

(ii) වගුවේ තොරතුරු අනුව ප්‍රස්තාරය සම්පූර්ණ කරන්න.




| පලතුරු වර්ගය | පලතුරු සංඛ්‍යාව |
|---|---|
| අඹ | 18 |
| රඹුටන් | 25 |
| පැපොල් | ... |
| පේර | 20 |

**48.** පැන්සල් 6 බැගින් ඇති පෙට්ටි හතරක් ද පැන්සල් 8 බැගින් ඇති පෙට්ටි තුනක් ද ඇත. එම පෙට්ටි **හතේ ම** ඇති පැන්සල් සංඛ්‍යාව කීය ද? ..................

**49.** සමන්ති ඉපදුණේ 1995 වර්ෂයේ අගෝස්තු 21 දින ය. අද දිනට ඇයගේ වයස අවුරුදු කීය ද?

..................

**50.** 25 cm බැගින් දිග ලෝහ පටි කැබලි 4 ක්, තනි දිග පටියක් වන සේ පාස්සා ගන්නා ලදී. සෑම පැස්සුමක ම එක් එක් ලෝහ පටියෙන් 5 cm බැගින් එක මත එක තැබීමට සිදුවිය. අවසානයට ලැබෙන ලෝහ පටියේ දිග කොපමණ ද? ............... cm


[8 වැනි පිටුව බලන්න.

51. රූපයේ දී ඇති තොරතුරු අනුව, වගුවෙහි හිස්තැන පුරවන්න.





| සිට | තෙක් | දුර |
|---|---|---|
| කොළඹ | මාතර | 160 km |
| ගාල්ල | මාතර | 45 km |
| ගාල්ල | හම්බන්තොට | 125 km |
| කොළඹ | හම්බන්තොට | ......... km |

52. රූපයේ දැක්වෙන බිම් කොටසෙහි පරිමිතිය සොයන්න.




............ m ............ cm

53. පැණිබීම ලීටරයකින්, මිලිලීටර 275 බැගින් වන වීදුරු 3 ක් වෙන් කර ගත් විට ඉතිරි වන ප්‍රමාණය කොපමණ ද?
(ලීටර 1 = මිලිලීටර 1000)




.................. ml

- හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා **යටින් ඉරක් අඳින්න.**

54. හේරත්හාමි ඉතිරි බුලත් ටික බිරිඳ අතට ......... (දුන්නේ ය. /දුන්නෝ ය.)

55. කුමාරගුප්ත ......... (බළලෙක් / බළලකු) මෙන් දී කිරට ආශා කරන්නෙකි.

56. අතීත ශ්‍රී ......... (ලාංකිකයෝ /ලාංකිකයන්) කාලය මැනීම සඳහා පැතැටිය උපයෝගී කර ගත්හ.

57. ......... (මා / මම) දුටු අවුරුදු සිරිත් විරිත්

58. පුංචි ළමයි පොත් කියවීමෙන් විනෝදයක් ......... (ලබයි. / ලබති.)

59. අතීතයේ සිටි රජවරුන්ගෙන් ඇතැම් අය වැව් බැඳීමට උත්සාහ ......... (කළේ ය. / කළෝ ය.)

60. **"අපේ පාසල ඉතා සුන්දර ය."** යන මාතෘකාව යටතේ වාක්‍ය **තුනක්** ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන **පහකට වැඩි** විය යුතු ය. **උක්ත ආඛ්‍යාත සම්බන්ධය** ද නිවැරදි විය යුතු ය.)

(i) ..............................................................................................................
..............................................................................................................

(ii) ..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

(iii) ..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

***